# තිරියායී (සංස්කෘත) පර්වත ලිපියෙන් හෙළිවෙන සමකාලීන විදේශීය වෙළෙඳාම

පී. තරිඳු මධුශාන් පීරිස්*

පුරාණ ලංකාවේ අන්තර්ජාතික වෙළඳාම පිළිබඳ අධ්‍යයනයේ දී සංස්කෘත අභිලේඛන වැදගත් වේ. මෙමඟින් ක්‍රි.ව හත්වන සියවසට පමණ අයත් තීරියායී සංස්කෘත ලිපියේ සඳහන් තොරතුරු ඇසුරින් සමකාලීන යුගයේ ලංකාව විදේශීය රටවල් සමග පැවැත් වූ වෙළෙඳාම සම්බන්ධයෙන් තොරතුරු අධ්‍යයනයට ලක්කරයි. *ගිරිකණ්ඩ (ගිරිහඬු සෑය)* ස්තූපය වර්ණනා කිරීම ශිලා ලේඛනයෙහි අරමුණ වන අතර, ශ්ලෝක කිහිපයකින් ම මෙම ස්ථානයට විදේශීය රටවලින් වෙළෙඳුන් පැමිණි බවට සාධක හමුවේ. ක්‍රි.ව හත් වන සියවස ලංකාව ඉන්දියන් සාගරයේ වැදගත් වෙළෙඳ මධ්‍යස්ථානයක් වශයෙන් පැවති අතර, දකුණු ඉන්දියානුවන්, රෝම ජාතිකයන්, පර්සියන් ජාතිකයන් හා ඉතියෝපියන් වරු මෙන් ම චීන ජාතිකයන් ද මෙරටට වෙළෙඳාමේ පැමිණ තිබේ. එමෙන් ම මෙම ලිපියේ ස්ථාන කිහිපයම *අවලෝකිතේශ්වර බෝධිසත්ත්වයන්* සම්බන්ධයෙන් සඳහන් කරන අතර, මෙම ස්ථානය මහායානිකයන්ගේ මධ්‍යස්ථානයක් වූ බවත් අවලෝකිතේශ්වර සමුද්‍ර යාත්‍රාවන්ට ආරක්ෂාව සපයන බව විශ්වාසයේ පැවතිමත් මෙම ස්ථානය කේන්ද්‍ර කරගනිමින් නාවික ගමනාගමනය සිදුවූ බව සනාත කරවයි. එමෙන් ම, සමකාලීන යුගයේ ඉන්දියානු සාගර කලාපය තුල ප්‍රධාන භාෂාව වශයෙන් සංස්කෘත භාෂාව ජනප්‍රිය වීමත්, තිරියායි ලිපිය සංස්කෘත භාෂාවෙන් රචනා වීමත් තිරියාය කේන්ද්‍ර කරගනිමින් විදේශිය වෙළෙඳාමක් පැවති බව තහවුරු වේ.

**ප්‍රමුඛ පද :** තිරියායී ලිපිය, අන්තර්ජාතික වෙළඳාම, අවලෝකීතේශ්වර විශ්වාසය.

* පුරාවිද්‍යා අධ්‍යන අංශය , කැලණිය විශ්වවිද්‍යාලය ,කැලණිය ptmperis@gmail.com